# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2008 අංක 13 දරන ගෝඝාතක (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 පෙබරවාරි මස 29 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

**2008 අංක 13 දරන ගෝඝාතක (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2008 පෙබරවාරි මස 29 වන දින]

එල්.ඩී.—ඕ. 9/2008.

**ගෝඝාතක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2008 අංක 13 දරන ගෝඝාතක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (272 වන අධිකාරය වූ) ගෝඝාතක ආඥාපනතේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 272 වන අධිකාරයේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) (බලපත්‍රලාභී ගෝඝාතකයකු නොවන) කිසිදු පුද්ගලයකු විසින් නිසි අධිකාරියකින් ලබාගත් බලපත්‍රයක් නොමැතිව කිසිදු ගවයකු ඝාතනය කිරීම නීත්‍යානුකූල නොවන්නේ ය :

එසේ වුවද අධිකාරියකින් ලබාගත් බලපත්‍රයක් ඇතිව හෝ නැතිව ගර්භනී ගව දෙනුන් හෝ කිරි දෙනුන් ඝාතනය නොකළ යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තිය, (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) නැවත අංක යොදන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) 18 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි ප්‍රතිපාදන වලට පටහැනිව ගර්භනී ගව දෙනුන් හෝ කිරි දෙනුන් ඝාතනය කරනු ලබන ඕනෑම පුද්ගලයකු, වරදකට

වරදකරු වන අතර, රුපියල් පනස් දහසක දඩයකට සහ වසර තුනකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.